## 2021/05/11 දින පැවති මහාසභා රැස්වීම් වාර්තාව

2021/05/11 දින පෙ.ව. 9.00 ට නාගොඩ ප්‍රදේශීය සභා රැස්වීම් ශාලාවේදී රැස්වීම පවත්වන ලදී.

**සහභාගීත්වය**

| | | |
|---|---|---|
| 1. | නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | ගරු සභාපති |
| 2. | එම්.කේ. ගාමිණී සුසන්ත මහතා | ගරු උප සභාපති |
| 3. | ඒ.එච්.වී. අජිත් කුමාර මහතා | ගරු මන්ත්‍රී |
| 4. | ඩබ්. ජී. නිශාන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 5. | සී.වී. සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 6. | බන්දුල සමන්ත හිරිමුතුගොඩ | ගරු මන්ත්‍රී |
| 7. | එච්.ජී. තරංග සුදර්ශන මහතා | ගරු මන්ත්‍රී |
| 8. | කුමාරගේ වසන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 9. | එච්.කේ.ලක්රුවන් සම්පත් මහතා | ගරු මන්ත්‍රී |
| 10. | එන්.ජී. ගයාන් මධුෂංඛ මහතා | ගරු මන්ත්‍රී |
| 11. | ධර්මසිරි ගනේවත්ත මහතා | ගරු මන්ත්‍රී |
| 12. | පියල් හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |
| 13. | සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය | ගරු මන්ත්‍රිනී |
| 14. | එඬේරආරච්චි වෙරංග ලක්මාල් මහතා | ගරු මන්ත්‍රී |
| 15. | නාපෙ විතානගේ සමන් මහතා | ගරු මන්ත්‍රී |
| 16. | සී. වනිගරත්න මහතා | ගරු මන්ත්‍රී |
| 17. | විලේගේ අමර ධනංජය මහතා | ගරු මන්ත්‍රී |
| 18. | ප්‍රියන්තා ගුණසේකර මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 19. | එම්.එම්.දිසානායක මහතා | ගරු මන්ත්‍රී |
| 20. | එන්.ඩබ්. පතිනායක මහතා | ගරු මන්ත්‍රී |
| 21. | විජිත් වීරගුණරත්න සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 22. | කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 23. | කේ.ඒ.සී. දිල්රුක්ෂි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 24. | එච්.එච්. ගයන්ති කුමාරි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 25. | ඩබ්. කේ. නෙලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 26. | පී.ජී. රංජිත් ජයවීර මහතා | ගරු මන්ත්‍රී |
| 27. | කේ.එච්.එම්.නදීකා දර්ශනී මිය | ගරු මන්ත්‍රිනී |

### 01. ආගම සිහි කිරීම

2021.05.11 දින මහා සභාව ආරම්භ කිරීමට පළමුව පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහි කිරීමෙන් අනතුරුව මිය ගිය ඥාතීන් රණවිරුවන් සිහිපත් කර විනාඩියක නිශ්ශබ්දතාවයක් පළ කළේය.

**02. මූලාසනයේ පිළිගැනීමේ කතාව**

සියලු දෙනාගෙන්ම අවසරයි. සියලු දෙනාටම සුබ දවසක් සුබ අලුත් අවුරුද්දක් ප්‍රාර්ථනා කරමින්, අද දින සභා වාරය පවත්වන්න. මේ මොහොතේ පැමිණ සිටින මන්ත්‍රීවරුන් පිළිගැනීම යුතුකමක්. ඒ අනුව මේ අවස්ථාවේ පැමිණ සිටින. ගරු උපසභාපති ගාමිණී සුසන්ත මැතිතුමා ඇතුලු සියලු මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලා පිළිගන්නවා. මේ වන විට රටේ පවතින කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් දුරස්ථ භාවය රැකගෙන අපි මෙතෙක් කල් සභාව පැවැත්වුවා. මීට වසරකට කලින් මේ වසංගත තත්වය හමුවේ අපේ සභාවාරයන් තියන්නත් නොහැකි වුනා. මොකද නීත්‍යානුකූලව සෞඛ්‍ය හේතූන් මත අපහසුතා ගොඩක් මැද තමයි අපි සභාවාරය පැවැත්වුවෙ. නමුත් අපි තීරණය කළා. මේ සභා වාරය මෙම ශාලාවෙ පෙරසේම තියන්න. මේ වන විට මේ ප්‍රදේශයේ කොවිඩ් වසංගත තත්වය යම්තාක් දුරට මර්ධනය කරලා, යහපත් අයුරින් ක්‍රියාත්මක වෙන නිසා අපි කල්පනා කළා. සභා වාරය මේ ආකාරයට තියන්න. ඒ අනුව අද මෙම ස්ථානයේ පෙර පරිදිම සභා වාරය පවත්වන්න, යම් අපහසුතා ඇති වුවත් ඒක දරාගන්න කියල මම ඉල්ලා සිටිනවා. උදේ දුරකතනෙන් මට ධර්මසිරි මන්ත්‍රීතුමා, පියල් මන්ත්‍රීතුමා, සහ පතිනායක මන්ත්‍රීතුමා ප්‍රමාද වී පැමිනෙන බව දැනුම් දුන්නා. ඒ අනුව මේ අවස්ථාවෙ පැමිණ සිටින ගරු උප සභාපතිතුමා මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලා මම ගෞරවයෙන් පිළිගන්නවා. විශේෂයෙන්ම කියන්න ඕන. උදාවෙන අලුත් අවුරුද්ද නිසා නියමිත දිනට දින හතකට කලින් තමයි අපි සභාව පවත්වන්න යෝජනා කළේ. එහෙමනම් ඔබ සියලු දෙනාම ගෞරවයෙන් පිළිගන්නවා.

**(අ)01. 2021.04.06 දින පැවති මහ සභා වාර්තාවේ නිවැරදි කිරීම් ඇත්නම් ඒවා නිවැරදි කර වාර්තාව ස්ථිර කිරීම.**

**(අ)02. පසුගිය වාර්තාවේ යෝජනා සඳහා ඉදිරිපත් කර ඇති සංශෝධන ඉදිරිපත් කිරීම**

**නැත**

2021.03.09 දින පැවති මහා සභාවේ සභා වාර්තාව සභාව පිළිගතයුතු සත්‍ය වාර්තාවක් ලෙස ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් යෝජනා කළ අතර ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**(ආ). සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

01. ප්‍රධාන ලේකම්, ප්‍රධාන ලේකම් කාර්යාලය, නාගොඩ විසින් යොමු කරන ලද නාගොඩ ප්‍රාදේශීය සභාවේ ලේකම් තනතුරෙහි රාජකාරී ඉටු කිරීම සඳහා කළමනාකරණ සේවා නිලධාරී III - එම්.ඒ.ඩිලානි චන්ද්‍රප්‍රභා මිය පත්කිරීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.

**(ඇ). සන්දේශ පෙත්සම් පැමිණිලි ඉදිරිපත් කිරීම**

01. පළාත් පාලන දෙපාර්තමේන්තුව, දකුණු පළාත් විසින් ග්‍රාමීය සාම්ප්‍රදායික ගම්මාන ඒකාබන්ධ සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම යන මැයෙන් 2021.04.0 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

02. උඩවැලිවිටිතලාව ප්‍රදේශවාසීන් විසින් යොමු කරන ලද 2021.05.09 දිනැති පිට වූ මාර්ගය කපා ගැනීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.

**සභාව විසින් කාර්යය ඉටු කර දීමට උත්සාහ ගන්නවා.යනුවෙන් ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.**

03. ඩබ්.ඒ. තුෂාරී වීරසිංහ මිය විසින් 2021.05.10 දිනැතිව යොමු කරන ලද උඩුගම සඳුදා සති පොළ සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.

04. මාලනී බණ්ඩාරිගොඩ, නව නගරය, තල්ගස්වල විසින් යොමු කරන ලද 2021.05.03 දිනැති ලිපිය සභාගත කරන ලදී.

05. ජී.කේ. නන්දන උපුල් මයා, වත්තෙහේන, තල්ගස්වල විසින් කොවිඩ් 19 දෙවැනි රැල්ල පාලනය සඳහා පොල නොපැවැත්වීම මත බදු නිදහස් කර ගැනීමට ඉල්ලුම් කිරීම යන මැයෙන් 2021.05.03 දිනැතිව යොමු කරන ලද ලිපිය සභාගත කරන ලදී.

**ඉහත සඳහන් 03,04,05 යන ඉල්ලීම් 3 ම සාධාරණ බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.**

06. ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ. ගාමිණී සුසන්ත මයා, විසින් කාර්මික නිලධාරීතුමා යොමු කර ඇස්තමේන්තු සකස් කර දෙන ලෙස ඉල්ලීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.

07. සභාපති, නෙළුව ප්‍රාදේශීය සභාව විසින් JCB රථය සඳහා උපාංග ලබා ගැනීම සම්බන්ධ ලිපිය සභාගත කරන ලදී.

**මෙම ඉල්ලීමට සභාවේ එකඟත්වය හිමි නොවුනි. සම්පූර්ණ වාහනයම මුදලකට නෙළුව සභාවටම ගන්නා ලෙස හෝ නොමැතිනම් වෙන්දේසි කිරීමට යෝජනා විය.**

**(ඇ). යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**

නැත

**(ඉ). යථා පරිදි කල් දී ඇති යෝජනා**

**(ඉ). 1. ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩ විතාන මහතා ඉදිරිපත් කරන පරිපාලන යෝජනා.**

**01. සභා රීති 11(8) යටතේ කරනු ලබන හදිසි යෝජනා**

01.01.නාගොඩ ප්‍රාදේශීය සභාවේ 2019.03.19 දින සිට 2021.04.28 දින දක්වා සේවය කල චන්ද්‍රිකා දයාවංශ මහත්මිය සේවයෙන් විශ්‍රාම ගැනීම හේතුවෙන් පුරප්පාඩු වූ ලේකම් තනතුර සඳහා ප්‍රාදේශීය සභාවේ වැඩ බලන ලේකම් ලෙස කළමනාකරණ සේවා නිලධාරී III ශ්‍රේණියේ සේවය කරනු ලබන එම්.ඒ ඩිලානි චන්ද්‍රප්‍රභා මහත්මිය පත් කිරීමට යෝජනා කරමි.

නාගොඩ ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී තනතුර සඳහා චන්දිමා සෙනවිරත්න මහත්මිය පත් කිරීමටත් යෝජනා කරමි.

පහත සසඳහන් බැංකු ගිණුම්වල චෙක්පත් අත්සන් කිරීමට පළමු අත්සන්කරු ලෙස වැඩ බලන ලේකම් ධූරයට පත් කරන ලද එම්.ඒ ඩිලානි චන්ද්‍රප්‍රභා මහත්මිය සහ දෙවන අත්සන්කරු ලෙස ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී, චන්දිමා සෙනවිරත්න මහත්මිය වෙත බලය පැවරීමට යෝජනා කරමි.

තල්ගස්වල මහජන බැංකුව (පොදු අරමුදල) - 272100110000027
තල්ගස්වල මහජන බැංකුව (සේවක ණය) - 272100150000030
තල්ගස්වල ලංකා බැංකුව (රජයේ ආධාර) - 0004766271

**ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

01.02.නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පවතින අනවසර ව්‍යාපාරවලින් වාර්ෂික ව්‍යාපාර බදු මුදලක් (කොන්දේසි ඇතුලත්ව) අය කිරීම සුදුසු යැයි ගරු සභාවට යෝජනා කරමි.

**මෙම යෝජනාව අනුමත නොවූ අතර, පසුව සාකච්ඡා කිරීමට යෝජනා විය.**

**09. ඉදිරි ගෙවීම් වාර්තාව ඉදිරිපත් කිරීම**

**<u>2021.05.11 දින පවත්වනු ලබන මහසභා රැස්වීම සඳහා ඉදිරිපත් කළ යුතු ඉදිරි ගෙවීම් වාර්තාව.</u>**

**01.ලංකා විදුලිබල මණ්ඩලය**
**2021 අප්‍රේල් මස විදුලි බිල්පත්**

| | | |
|---|---|---|
| 4594192319 | - උඩුගම උප කාර්යාලය | - රු.1246.50 |
| 8617046104 | - උඩුගම බහුකාර්ය මධ්‍යස්ථානය | - රු. 697.50 |

**2021 මාර්තු මස විදුලි බිල්පත්**

| | | |
|---|---|---|
| 459082800 | - උදාර පෙර පාසල | - රු. 496.20 |
| 4599064300 | - ගෝනදෙනිය පෙර පාසල | - රු. 240.00 |
| 2810125104 | - දීප්ති පෙර පාසල | - රු. 258.30 |
| 2810236100 | - මාපලගම කරුණාතිලක ක්‍රීඩාංගනය | - රු. 240.00 |
| 4593739918 | - මාපලගම උප කාර්යාලය | - රු.1008.60 |
| 4501090200 | - මාපලගම වෙලඳ සංකීර්ණ කොරිඩෝව | - රු. 349.80 |
| 2809093105 | - කොම්පෝස්ට් ව්‍යාපෘතිය | - රු.1484.40 |

**2021 පෙබරවාරි මස විදුලි බිල්පත්**

| | | |
|---|---|---|
| 459082800 | - උදාර පෙර පාසල | - රු. 240.00 |

**02. 2021 මාර්තු මස දුරකථන බිල්පත්**
**ශ්‍රී ලංකා ටෙලිකොම් පී එල් සී**

| | | | |
|---|---|---|---|
| i. | 0912231201 | - සභාපතිතුමාගේ නිවස | - රු. 6899.61 |
| ii. | 0912296577 | - මාපලගම උප කාර්යාලය | - රු. 700.51 |
| iii. | 0912296537 | - සභාපතිතුමාගේ නිල කාමරය | - රු. 4039.48 |
| iv. | 0912296433 | - ප්‍රධාන කාර්යාලය | - රු. 5125.98 |

**සී/ස ලංකාබෙල් සමාගම,**
උපසභාපතිතුමාගේ නිවසේ දුරකථන බිල්පත් පියවීම (2021.03.16-2021.04.15) - රු. 613.00

**<u>03 .2021 අප්‍රේල් මස පරිවර්තිත ගමන් වියදම් ගෙවීම (ක්ෂේත්‍ර නිලධාරින් සඳහා)</u>**

| | | |
|---|---|---|
| කුසල් අසංක එදිරිසිංහ මයා | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 5500.00 |
| කේ.එල්.එන්.ප්‍රමෝද මයා | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 4400.00 |
| අනුෂා සමරවික්‍රම මෙය | - තාක්ෂණ සේවා නිලධාරී | - රු. 3000.00 |
| කේ.ජී.ජයනි මිය | - සංවර්ධන නිලධාරී | -රු. 4745.00 |

| | | |
|---|---|---|
| ඩබ්.ජේ.ඒ.ශානක මයා | - ආදායම් පරීක්ෂක | -රු . 4000.00 |
| මානෙල් සුදර්ශනී මිය | - සංවර්ධන නිලධාරී | - රු. 6000.00 |

**<u>04.2021 මැයි මස ගමන් වියදම්</u>**

**පුහුණු වැඩසටහන් සඳහා සහභාගීවීම වෙනුවෙන්**

| | | |
|---|---|---|
| කේ.කේ.අවන්ත පද්ම මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 350.00 |

**<u>2021 අප්‍රේල් මස ගමන් වියදම්</u>**

**පුහුණු වැඩසටහන් සඳහා සහභාගීවීම වෙනුවෙන්**

| | | |
|---|---|---|
| ඒ එස්.මසීදා මෙය | - කළමනාකරණ සහකාර | - රු. 790.00 |
| කේ.කේ.අවන්ත පද්ම මයා | - කාර්යාල කාර්ය සහායක | - රු.3030.00 |
| ඩබ්.ඒ.සී.මධුෂානි මිය | - කාර්යාල කාර්ය සහායක | - රු.4580.00 |

<u>ආයතනයේ රාජකාරි ගමන්වල නියලීම වෙනුවෙන්</u>

| | | |
|---|---|---|
| නිමල් වික්ටර් නාගොඩවිතාන මයා | - සභාපති | - රු. 2000.00 |
| එම්. ඒ වසන්ත මයා | - රියදුරු | - රු. 3500.00 |
| අනුර දිසානායක මයා | - රියදුරු | - රු. 700.00 |

**<u>05. අතිකාල දීමනා ගෙවීම්</u>**

**<u>2021 අප්‍රේල් මස</u>**

| | | |
|---|---|---|
| එම්.ඒ.වසන්ත මයා | - රියදුරු | - රු. 9046.04 |
| ඩී.ටී.ආර්.ඒ. ගුණරත්න මයා | - මුරකරු | - රු. 8583.00 |
| ඒ.එච්.ජී. සංජීව මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු (මුර සේවයේ යෙදීම වෙනුවෙන්) | - රු. 8124.75 |
| එන්.එම්.රජිත මයා | - අනියම් මුරකරු | - රු. 6567.00 |
| ඩබ්.කේ. සම්පත් සංජීව මයා | - අනියම් රියදුරු | - රු. 8560.00 |
| යසරත්න විජේසේකර මයා | - මුරකරු | - රු.10282.00 |
| බී.ජී.පියතිලක මයා | - රියදුරු | - රු. 2486.00 |
| පී.කේ.චමිත් නිශාන්ත මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 3751.00 |
| කේ. එච්. එම්. කැළුම් චාමර මයා | - අනියම් රියදුරු | - රු. 8596.00 |
| අනුර දිසානායක මයා | - රියදුරු | - රු. 6566.00 |
| හර්ෂ කුමාර මයා | - සෞඛ්‍ය කම්කරු | - රු. 5896.00 |
| එස්.ඩී.එම්.කැටිපෙආරච්චි මයා | - විදුලි කාර්මික | - රු. 2625.00 |
| අයි.කේ.ඉන්දික මයා | - වැඩ/ක්ෂේත්‍ර කම්කරු | - රු. 1092.00 |
| ඩී.සමන් ප්‍රදීප් මයා | - සෞඛ්‍ය කම්කරු | - රු. 2773.76 |
| ඩබ්.ජී. දයානන්ද මයා | - සෞඛ්‍ය කම්කරු | - රු. 2275.00 |
| කේ.එම්.එම්.නිශාන්ත ඉදුනිල් මයා | - රියදුරු | - රු. 8239.00 |

**06. සභාපති, නාගොඩ ප්‍රාදේශීය සභාව**

i. 2021 මාර්තු මස මන්ත්‍රීවරුන් සඳහා ඉන්ධන ලබා ගැනීමේ බිල්පත - රු.81000.00

**07. එච්.එල්.කේ.ශ්‍රීනිත් රුක්ෂාන් මයා, උඩුගම**

උඩුගම මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම
2021 අප්‍රේල් - රු. 4380.00

**08. ඒ.ඩී. කරුණාරත්න මයා, සරත් ස්ටෝර්ස්, යටලමත්ත**

නාගොඩ මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම
2021 අප්‍රේල් - රු. 6490.00

**09. එම්.ඒ.සිරිපාල මයා, සේසිරි ස්ටෝර්ස්, මාපලගම**
මාපලගම මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම
2021 ජනවාරි - රු. 2510.00
2021 පෙබරවාරි - රු. 2250.00
2021 මාර්තු - රු. 2500.00

**10. බී.ජේ. කරුණාරත්න මයා, රත්නගිරි ස්ටෝර්ස්, මාපලගම**
මාපලගම මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම
2021 ජනවාරි - රු. 5300.00
2021 පෙබරවාරි - රු. 4170.00
2021 මාර්තු - රු. 5110.00

**11. ගරු සභාපති, නියාගම ප්‍රාදේශීය සභාව**
වළකුඹුර ආදාහනාගාර මාර්ගය සෑදීම වෙනුවෙන් ගෙවීම් කිරීම - රු. 14000.00

**12. ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව, මහරගම**
මාපලගම නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාව සඳහා අවශ්‍ය බෙහෙත්
මිළදී ගැනීමේ බිල්පත - රු. 39340.00

**13. ඊ-බේස් කම්පියුටර් ටෙක්නොලොජී**
UPS එකක් ලබා ගැනීමේ බිල්පත - රු. 4950.00

**14. නිව් විජය මෝටර්ස්, ගාල්ල**
LL 7103 ටිපර් රථය සඳහා ටයර් 06 ක් ටියුබ් 01, රිම් ටේප් 04 ක් ලබා ගැනීමේ බිල්පත - රු.255800.00

**15. එල්.එස්.ආර්. විජේතිලක මයා,ගා/නාගොඩ**
නාගොඩ ප්‍රාදේශීය සභා කැකුළු පෙර පාසල පවත්වා ගෙන යනු ලබන ගොඩනැගිල්ල
බදු පදනම මත පවත්වා ගෙන යන බැවින් ඒ සඳහා මැයි මස මාසික කුලීය ගෙවීම - රු. 5000.00

**16. දයානි ට්‍රේඩ් සෙන්ටර්, මාපලගම**
- **i.** තණකොල කපන යන්ත්‍රය සඳහා උපාංග ලබාගැනීමේ බිල්පත - රු.2060.00
- **ii.** තණකොල කපන යන්ත්‍රය සඳහා කේබල් ලබාගැනීමේ බිල්පත - රු. 650.00

**17. එම්.ජේ. ජනිත් ඉරේෂ් කුමාර මයා, වදුරඹ**
- i. ප්‍රාදේශීය සභාවේ 2021.04.06 වන දින පැවැත්වූ මාසික මහා සභා රැස්වීමේ සංග්‍රහ බිල්පත (කෑම සඳහා) - රු. 7460.00

**18. ආසිරි ඔටෝ සර්විස්, ගාල්ල**
RA 8569 ට්‍රැක්ටරය සේවා කිරීමේ බිල්පත - රු.20578.00

**19. සරත් ගමගේ මයා, උඩලමත්ත**
අනතුරුදායක ගස් ඉවත් කිරීම සඳහා භාහිර සේවකයින් යෙදවීම වෙනුවෙන් ගෙවීම් කිරීම - රු. 4000.00

**20. කේ.එම්.ටී.ඩිස්ට්‍රිබියුටර්ස්, ගාල්ල**
වීථි පහන් අළුත්වැඩියාව සඳහා අවශ්‍ය LED බල්බ් මිළදී ගැනීමේ බිල්පත - රු.57000.00

**21. විගණකාධිපති, විගණන කාර්යාලය**

i. හිඟ විගණන ගාස්තු ගෙවීම - රු.10000.00

**22. යශෝධරා රශිනි නාගොඩවිතාන මෙය**

සභාපතිතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරී සඳහා දීමනා ගෙවීම
(2021 අප්‍රේල්) - රු.13000.00

**23.ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී. ගයාන් මදුසංක මයා**

කැටගොඩ හංදිය අසළ ගඟ හරහා ඇති පාලමේ අබලන් වූ ස්ථාන පිළිසකර කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියෙන් පැමිණි සේවකයින් හට අබලන් වූ ස්ථාන සඳහා අවශ්‍ය කරන ඇණ මිළදී ගැනීම වෙනුවෙන් බිල්පත් මුදල් ප්‍රතිපූර්ණය කිරීම - රු.1500.00

**24. ඇල්බට් චිත්‍ර ශිල්පියෝ, ගාල්ල**

ලේකම් (වැ.බ.), කලමනාකරණ සේවා නිලධාරී සීල් එක සකස් කිරීමේ බිල්පත - රු. 450.00

**25. කේ.ටී.ආර්.ජී. උමාල් කිරිඇල්ල මයා, ග්‍රෑන්ඩ් මෝටර්ස්, වදුරඹ**

I. PF 7360 කැබ් රථය සඳහා බ්‍රේක් පෑඩ් දැමීමේ බිල්පත - රු. 10000.00

II. PF 7360 කැබ් රථයේ සී වී බූට්එක අලුතින් යෙදීමේ බිල්පත - රු. 4700.00

**26. ඒ.කේ.නිලන්ති සජීවනී,ග්‍රාෆ් ටෙල් කමියුනිකේෂන්**

i. සභාපතිතුමා,උප සභාපතිතුමා ඇතුලු මන්ත්‍රී මණ්ඩලයට 2021 අප්‍රේල් මස දුරකථන පෙර ගෙවුම් කාඩ්පත් ලබා දීමේ බිල්පත පියවීම -රු28500.00

ii. 2021 අප්‍රේල් මස සභා වාර්තාව පිටපත් 30 ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් ගෙවීම් - රු. 2940.00

**27. නානායක්කාර හාඩ්වෙයාර්, නාගොඩ**

තණකොළ කපන තල ලබා ගැනීමේ බිල්පත - රු. 850.00

**28. අබේනායක ඔටෝ සර්විස්, ගාල්ල**

PF 7360 කැබ් රථය සේවා කිරීමේ බිල්පත - රු.16520.00

**29. කේ ධර්මවර්ධන මයා, බද්දේගම**

ආදාහනාගාර පිවිසුම් මාර්ගය ස්කවේටර් යන්ත්‍රයක් යොදා සකස් කිරීම
වෙනුවෙන් ගෙවීම - රු.104725.00

**30. සඳරු ග්‍රොසරි ඇන්ඩ් ග්‍රයින්ඩින් මිල්ස්, නාගොඩ**

i. ප්‍රාදේශීය සභාවේ 2021.04.06 වන දින පැවැත්වූ මාසික මහා සභා රැස්වීමේ සංග්‍රහ බිල්පත - රු. 4339.00

**<u>31. දස මස් වැටුප් අත්තිකාරම්</u>**

ජී. ඉෂානි දීපිකා, පරිගණක ක්‍රියාකරු, - රු.250000.00

**<u>32. ඊ.ඒ.සමන් කුමාර එදිරිසිංහ මයා, උඩුගම</u>**

LL 7650 කෘ කැබ් රතය අලුත්වැඩියා කිරීමේ බිල්පත පියවිම - රු.4160.00

**පොදු අරමුදල්**

**33. එන්.පී. නිස්සංක ප්‍රදීප් කුමාර මයා, මුලන**

i. වාඩියකන්ද ගම්මානයට යන වේල්ල මාර්ගයේ ඇති වලවල් පස් දමා ගොඩකර සංවර්ධනය කිරීම වෙනුවෙන් ගෙවීම - රු. 14910.00

**රජයේ ආධාර**

**මන්ත්‍රී ප්‍රතිපාදන ( පාර්ලිමේන්තු මන්ත්‍රී සම්පත් අතුකෝරල මැතිතුමා)**

**34. කේ.එම්.ජී.ගයාන් චතුරංග මයා, තල්ගස්වල**

214 ඩී මාරකන්ද නව ගම්මාන මාර්ගය ජේසීබී යන්ත්‍රය යොදා සංවර්ධනය කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම - රු. 37500.00

**ඉදිරි ගෙවීම් වාර්තාවේ සඳහන් ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීම සුදුසු බව ගරු සභාපතිතුමන් කල යෝජනාව ගරු මන්ත්‍රීනී සුභාෂි ඒකනායක මහත්මිය විසින් ස්තීර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

**(ඉ).2 කර්මාන්ත යෝජනා**

**(ඉ) 2. ගරු සභාපතිතුමන් හා ගරු මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන යෝජනා.**

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එන්.ඩබ්ලිව්. පතිනායක මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

01. 222 ඒ, ඌරල දකුණ ග්‍රාම නිලධාරී වසමේ මල්වත්තහේන ඇසිලින් මහත්මියගේ නිවස ඉදිරියෙන් තියෙන මාර්ගයට බෝක්කු, සිළිංඩර් යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී එන්.ඩබ්ලිව්. පතිනායක මහතා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී සමන් විතානගේ මහතා විසින් ස්තීර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

**(ඉ)3. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම**

01. බටහේන්ගොඩ වේල්ල මාර්ගයේ දෙපස ඉවුරු බාදනය වී ඇති ස්ථානය ප්‍රතිසංස්කරනය කිරීම රු. 25100.00
02. උඩුගම නැගෙනහිර ජනසවිය ගම්මානයේ සිට ගුලන කන්ද මාර්ගය බැකෝ යන්ත්‍රය යොදා සංවර්ධනය කිරීම රු. 90000.00
03. වාඩියකන්ද මාර්ගයේ බෝක්කුව අළුත්වැඩියා කිරීම රු. 140000.00
04. නො.20 කුඹුරුහේන මාර්ගය පිළිසකර කිරීම රු. 50000.00

**ඉහත සඳහන් ඇස්තමේන්තු සභාව පිළිගත යුතු බවට ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්තීර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.**

05. වළකුඹුර ආදාහනාගාරය ඉදිකිරීමට සකස්කල ඇස්තමේන්තුව රු.50,806,332.32
06. උඩුගම සති පොළේ නව කඩ කාමර ඉදි කිරීම (2 අදියර) රු. 560,000.00

**ඉහත සඳහන් ඇස්තමේන්තු සභාව පිළිගත යුතු බවට ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඉ).4 මිළ ගණන් ඉදිරිපත් කිරීම**

**ටයර් ඩැග් කිරීම සඳහා මිළ ගණන් කැදවීම**

| **විස්තරය** | **සමන්ත ටයර් සෙන්ටර්, කරාපිටිය** | **විජෙතුංග ගෘප් කම්පැනි, ගාල්ල** | **රුහුණු 2001 මාගාල්ල** |
|---|---|---|---|
| **650 x 16 ටයර්** | **6400.00** | **Tractor 5101.00** | **Tractor 5390.00** |
| **600 x 12 ටයර්** | **5400.00** | **Tractor 3453.00** | **Tractor 3720.00** |
| **750 x 16 ටයර්** | **7300.00** | **9635.00** | **7100.00** |
| **600 x 16 ටයර්** | **5950.00** | **Tractor 4769.00** | **Tractor 4950.00** |
| **12.4 x 28 ටයර්** | **16000.00** | **15100.00** | **15700.00** |
| **900 x 20 ටයර්** | **9700.00** | **9300.00** | **9500.00** |
| **825 x 20 ටයර්** | **8950.00** | **8750.00** | **8800.00** |
| **265 x 70 x 16 ටයර්** | | | |
| **205 x 70 x 16 ටයර්** | | | |
| **600 x 16 ටයර්** | | **Normal 5505.00** | |
| **650 x 16 ටයර්** | | **Normal 6000.00** | |

නාගොඩ ප්‍රාදේශීය සභාවේ 2021 වර්ෂය සඳහා වාහන අමතර කොටස් මිලදී ගැනීම වෙනුවෙන් ලැබී තිබූ මිළ ගණන් අනුව හොඳම මිළ ගණන් ඉදිරිපත් කල නිව් විජය මොටර්ස් - ගාල්ල මගින් 2021 වර්ෂය සඳහා වාහන අමතර කොටස් මිලදී ගැනීම සුදුසු බව ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා විසින් යෝජනා කල අතර, ගරු මන්ත්‍රි පියල් හිරිමුතුගොඩ මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**(ඊ) කාරක සභා වාර්තා**

**(උ). ලැබීම් හා ගෙවීම් වාර්තා**

- 2021 අප්‍රේල් මාසයට අදාල ආදායම් ලැබීම් හා වියදම් ගෙවීම් වාර්තාව 2021 මැයි මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම
- 2021 අප්‍රේල් මාසයට අදාළ මාසික ඒකාබද්ධ වැය සාරාංශය 2021 මැයි මස මහා සභාව වෙත ඉදිරිපත් කිරීම

**(ඌ) වෙනත් කරුණු :-**

සභාපති,
නාගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී දිනය:-